# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1618/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 24/12/2023<br>පැය 1800 |

# මාධ්‍ය නිවේදනය

**නත්තල් දේව මෙහෙයන් පැවැත්වෙන දේවස්ථාන සඳහා පොලිස් ආරක්ෂාව සැපයීම - පොලිස් මූලස්ථානය.**

2023 වර්ෂයේ එළඹෙන නත්තල් දිනයට සමගාමීව දිවයින පුරා කිතුණු දේවස්ථාන වල පැවැත්වීමට නියමිත දේව මෙහෙයන්ට ආරක්ෂාව ලබාදීමට වැඩබලන පොලිස්පතිවරයාගේ උපදෙස් මත විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කර ඇත. මේ පිළිබඳව අවස්ථා කිහිපයකදී පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඇතුලු සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට පොලිස් මූලස්ථානය මඟින් විශේෂ උපදෙස් නිකුත් කර තිබූ අතර, ඒ අනුව දිවයිනේ පොලිස් වසම් 582 ක පිහිටි කිතුණු දේවස්ථාන 2340 ක පමණ නත්තල් දිනයට සමගාමීව දේව මෙහෙයන් පැවැත්වෙන බවට හඳුනාගෙන ඇත. එම දේවමෙහෙයන් පැවැත්වෙන දේවස්ථාන වල බැතිමතුන් සම්බන්ධ කර ගනිමින් විශේෂ අරක්ෂක කමිටු ක්‍රියාත්මක කිරීමට වැඩබලන පොලිස්පතිවරයා විසින් උපදෙස් ලබා දුන් අතර, ඒ අනුව එම දේවස්ථාන සියල්ලම පාහේ ආවරණය වන පරිදි සිවිල් කමිටු ස්ථාපිත කර ඇත.

මේ වෙනුවෙන් මූලිකවම පොලිස් නිලධාරීන් 7500 කට වැඩි ප්‍රමාණයක්ද, ත්‍රිවිධ හමුදා නිලධාරීන් 1200 කට වැඩි ප්‍රමාණයක්ද යොදවා ඇත. යම් දේවස්ථානයක පූජකතුමෙකු එහි ආරක්ෂාව පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් එම පළාතේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කර ගත හැකි අතර, එහිදී ද ප්‍රමාණවත් ප්‍රතිචාර නොලැබුනේ නම් පොලිස් මූලස්ථානයේ ස්ථාපිත කර තිබෙන සුවිශේෂී අංකයක් වූ 011-2472757 අංකය අමතා සහාය ඉල්ලීමේ හැකියාව පවතින අතර, ඒ පිළිබඳව වැඩබලන පොලිස්පතිතුමා සෘජුවම මැදිහත්වී කටයුතු කරනු ඇත.

ඒ අනුව දිවයිනේ සියළුම කිතුණු බැතිමතුන්ගේ නත්තල හා නත්තල් දේව මෙහෙයන් සහ ආරක්ෂාව සම්බන්ධව පොලිසිය නිරන්තරයෙන් කටයුතු කරනු බව අවධාරණය කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**